සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2019

**11 ශ්‍රේණිය** | **නර්තනය - I** | **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි ඃ
- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

- **අංක 01 සිට 10 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචනය තෝරන්න.**

01. රණශූරත්වය පිළිබඳ ගැයෙන ගායන විශේෂය ................................................................ නමින් හැඳින්වේ.
(1) සවරන් කවි (2) පන්තේරු කවි (3) හටන් කවි (4) උඩැක්කි කවි

02. "තවද අත්තා මුත්තා නත්තා පනත්තා" මෙම පද කොටස අයත් ගායනය ................................................ කි.
(1) වන්නම (2) ටීකාව (3) ප්‍රශස්තියකි (4) සැහැල්ලකි.

03. රවුමට නටනු ලබන ශාස්ත්‍රීය පද විශේෂය ................................................................ නමින් හැඳින්වේ.
(1) සවරන් කවි (2) පන්තේරු කවි (3) හටන් කවි (4) උඩැක්කි කවි

04. රත්නපුර මහ සමන් දේවාල පෙරහැරේදී ............................................ නැටුම් සඳහා විශේෂ තැනක් හිමිවේ.
(1) සබරගමු (2) උඩරට (3) කාවඩි (4) පහතරට

05. කෝලම් නාටක චරිත නිරූපණයේදී ........................................................ අධිමානුෂ චරිත ලෙස සැලකේ.
(1) නාගරාක්ෂ, නාගකන්‍යා, සිංහ (2) ගුරුළු රාක්ෂ, මරු රාක්ෂ, වලස්
(3) නාගරාක්ෂ, නාගකන්‍යා, කාපිරි (4) ගුරුළුරාක්ෂ, මරුරාක්ෂ, නාගකන්‍යා

06. ශාන්තිකර්මවල භාවිතා කෙරෙන සංවාද හා සැරසිලි ................................................. අභිනයට අයත් වේ.
(1) ආංගික හා වාචික (2) සාත්වික හා ආංගික
(3) වාචික හා ආහාර්ය (4) ආහාර්ය හා සාත්වික

07. සකපෝරුව හා ඉල්ලමම් ගැරීම ................................................................ කර්මාන්ත හා සම්බන්ධ වේ.
(1) ධීවර හා ගැමි (2) කෘෂි හා කොහු (3) කොහු හා පතල් (4) මැටි හා පතල්

08. මාත්‍රා 2+2+3 යන තාල රූපය ................................................................................................. වේ.
(1) සුළු මැදුම් දෙතිත (2) දෙසුළු මැදුම් තුන් තිත
(3) දෙසුළු මහ තුන් තිත (4) දෙමැදුම් මහ තුන්තිත

09. ආගමික කටයුතු සඳහා ................................................................................................. වාදනය කෙරේ.
(1) ගැටබෙරය හා තම්මැට්ටම (2) උඩැක්කිය හා හොරණෑව
(3) දවුල හා තම්මැට්ටම (4) තම්මැට්ටම හා උඩැක්කිය

10. පංචතූර්ය වාදන භාණ්ඩ අතුරින් ........................................................ ඝන හා සුසර භාණ්ඩ ගනයට අයත් වේ.
(1) තලිය හා තාලම්පට (2) පන්තේරුව හා බටනලාව
(3) හොරණෑව හා තාලම්පට (4) බටනලාව හා හොරණෑව

11. මහනුවර දළදා පෙරහැරේ දැක්ය හැකි උඩරට නර්තන සම්ප්‍රදායට අයත් විශේෂාංග මොනවා ද?
(1) උඩැක්කි, වේවැල් සහ වෙස් (2) උඩැක්කි, තෙල්මේ සහ වෙස්
(3) උඩැක්කි, පන්තේරු සහ වෙස් (4) පන්තේරු, වෙස් සහ තාලම්

12. නර්තනයක් නිර්මාණය කිරීමේදී වේදිකාවේ අවකාශ පිළිබඳ වඩාත් අවධානය යොමු කළ යුතු වන්නේ,

(1) නර්තන ශිල්පීන් සඳහා ය (2) පසුතල නිර්මාණ සඳහා ය

(3) බෙරවාදන ශිල්පීන් සඳහා ය (4) ගායන ශිල්පීන් සඳහා ය

13. බෙන්තර ගලපාත විහාරයේ ඇති මෙම රූපය කැටයම් කර ඇත්තේ,



(1) අනුරාධපුර යුගයේදී ය.

(2) ගම්පල යුගයේදී ය.

(3) දඹදෙනි යුගයේදී ය.

(4) කෝට්ටේ යුගයේදී ය.

- ප්‍රශ්න අංක 14 සිට 16 තෙක් නිවැරදි පිළිතුර පහත වගුව ඇසුරෙන් තෝරන්න.

| පේළිය | A තීරුව | B තීරුව | C තීරුව |
|---|---|---|---|
| 1 | ඉල්ලම් | අස්න | ඉල්ලම් මුදු |
| 2 | තෙල්මේ | කොහොඹා කංකාරිය | බෙර පුහුල |
| 3 | බලි ශාන්තිකර්මය | මුදුන්තාලය | දෙවොල් මඩුව |

14. දේශීය නර්තන සම්ප්‍රදායන් තුනට ම පොදු වූ ශාන්තිකර්මය සඳහන් වන්නේ,

(1) 1 පේල්යේ A තීරුවේ ය. (2) 2 පේළියේ B තීරුවේ ය.

(3) 3 පේළියේ C තීරුවේ ය. (4) 3 පේළියේ A තීරුවේ ය.

15. දවුලේ දක්නට ඇති සුවිශේෂ කොටස් ඇතුළත් වන්නේ,

(1) එක පේළියේ A හා C තීරුවල ය (2) දෙක පේළියේ A හා B තීරුවල ය

(3) දෙක පේළියේ B හා C තීරුවල ය (4) තුන පේළියේ A හා C තීරුවල ය

16. සබරගමු නර්තන අංගයක් ඇතුලත් වන්නේ,

((1)1 පේල්යේ A තීරුවේ ය. (2) 2 පේළියේ B තීරුවේ ය.

(3) 1 පේළියේ C තීරුවේ ය. (4) 3 පේළියේ B තීරුවේ ය.

17. ශ්‍රී ලංකාවේ පවතින වෘත්තීන් හා සම්බන්ධ ගැමි කවි ලෙස මේවා හැඳිනවිය හැකි ය.

(1) ගොයම් කවි, පාරු කවි,ධීවර කවි (2) වරම් කවි, යාග කවි, ධීවර කවි

(3) ගොයම් කවි, මල්යහන් කවි, කුලු කවි (4) පැල් කවි, ප්‍රශස්ති කවි, පාරු කවි.

18. දේශීය මුද්‍රා නාට්‍ය සම්ප්‍රදායක් ගොඩනැගීමේදී කොහොඹා කංකාරියේ එන පහත සඳහන් අංග තුළින් ද යම්කිසි ආභාසයක් ගත හැකි වේ.

(1) ගබඩා කොල්ලය සහ බුලත් පදය (2) අස්නෙ සහ නයා යක්කම

(3) මුවමල විදීම සහ මඩුපුරේ (4) ගුරුගේ මාලාව සහ ඌරා යක්කම

19. මේවා ශාන්තිකර්මවලට අයත් නොවන ගණයේ නර්තන අංග වේ.

(1) උඩැක්කි සහ පන්තේරු (2) රබන් සහ අස්නෙ

(3) පන්තේරු සහ හත්තාලය (4) උඩැක්කි සහ කොතල පදය

20. අනෙකුත් භාරතීය නර්තන සම්ප්‍රදායයන්ට වඩා කථකලි නර්තන සම්ප්‍රදායේවිවිධත්වය දක්නට හැක්කේ කුමන අංගවලින් ද?

(1) ගීත ගායනය සහ සංවාද (2) වේශ නිරූපණය සහ දෙබස්

(3) මුද්‍රා භාවිතය හා සංවාද (4) සාත්වික අභිනය සහ වේෂ නිරූපණය

21. ලාස්‍ය ලක්ෂණය ප්‍රබල ලෙස දැක්වෙන භාරතීයනර්තන සම්ප්‍රදාය ලෙස හැඳින්විය හැක්කේ කුමක් ද?

(1) කොල් බෙරය වාදනය අනුව නටන මණිපුරි නර්තන සම්ප්‍රදාය යි.

(2) තබ්ලාව වාදනය අනුව නටන මණිපුරි නර්තන සම්ප්‍රදාය යි.

(3) කෝල් බෙර වාදනය අනුව නටන චෞ නර්තන සම්ප්‍රදාය යි.

(4) චෙන්නා වාදනය අනුව නටන ඇසැම් නර්තන සම්ප්‍රදාය යි.

22. බෙර පද, කවි පද ආදිය නිවැරදි තාල ලක්ෂණ අනුව ප්‍රායෝගිකව භාවිතා කරන අයුරු ලියා දැක්වීම.
(1) ලිඛිත වාර්තා (2) රංග රචනය (3) ප්‍රස්ථාර කරනය (4) නර්තන රචනය

23. දේශීය නර්තන සම්ප්‍රදායයන් හී භාවිත රංග වස්ත්‍රාභරණවල වැඩි වශයෙන් දක්නට ලැබෙන වර්ණ නම්,
(1) කළු, රතු, කොළ, කහ (2) සුදු, රතු, කොළ, නිල්
(3) කලු, දුඹුරු, දම්, රතු (4) සුදු, රතු, කලු, නිල්


24. දෙවියන් උදෙසා පහතරට පවත්වන ශාන්තිකර්ම හඳුන්වනුයේ,
(1) මඩුයාග නමිනි. (2) තොවිල් නමිනි. (3) කංකාරි නමිනි. (4) බලියාග නමිනි.

25. අත්මල භාවිතා කරමින් ඉදිරිපත් කරන ශාස්ත්‍රීය නර්තනයකි.
(1) තෙල්මේ (2) මල් පදය (3) අස්නෙ (4) දළුමුර පදය

26. "විජය තුමා තම්මැන්නේ" ගීතයේ සංගීතය සහ ගීත රචනය සිදු කළේ,
(1) ඩබ්. ඩී. අමරදේව මහතා (2) ලයනල් අල්ගම මහතා
(3) විශාරද සුදත් සමරසිංහ මහතා (4) විශාරද සුනිල් ආරියරත්න මහතා

27. මහනුවර යුගයේදී වන්නම් හා ප්‍රශස්ති ගායනා වශයෙන් ඉදිරිපත් වූයේ දළදා මාළිගා භූමියේ පිහිටි,
(1) මගුල් මඩුවේදී ය. (2) සරස්වතී මණ්ඩපයේදී ය.
(3) ඉලංගම් මඩුවේදී ය. (4) කවිකාර මඩුවේදී ය.

- ප්‍රශ්න අංක 28 සිට 30 දක්වා රූපරාමු ඇසුරෙන් පිළිතුරු සපයන්න.




28. A සහ C වාද්‍ය භාණ්ඩ අයත් නර්තන සම්ප්‍රදායන් දෙකකි.
(1) උඩරට සහ සබරගමු සම්ප්‍රදාය (2) පහතරට සහ සබරගමු සම්ප්‍රදාය
(3) සබරගමු සහ උඩරට සම්ප්‍රදාය (4) පහතරට සහ උඩරට සම්ප්‍රදාය

29. පහතරට කෝලම් නාට්‍යට සහ විතත ගණයට අයත් වාද්‍ය භාණ්ඩ දෙකක් වනුයේ,
(1) A සහ B යන වාද්‍ය භාණ්ඩ වේ (2) B සහ C යන වාද්‍ය භාණ්ඩ වේ.
(3) B සහ D යන වාද්‍ය භාණ්ඩ වේ (4) A සහ D යන වාද්‍ය භාණ්ඩ වේ.

30. අංක 1 සහ 2 යන පිංතූරවලට අයත් රංග වස්ත්‍රාභරණ කොටස් දෙකකි.
(1) කරපටිය සහ කෛමෙත්ත ය (2) කරපටිය සහ බුබුළු පටිය ය.
(3) කරමාලය සහ ඉණපටිය ය. (4) නෙත්ති මාලය සහ කෛමෙත්ත ය.

31. කොහොඹා කංකාරියේ එන ගායනය රහිත නර්තන අංග දෙකකි.
(1) යක් ඇනුම හා ආවැන්දුම (2) ආවැන්දුම හා අස්නෙ
(3) අස්නෙ හා යක් ඇනුම (4) අස්නෙ හා මඩුපුරය

32. "ගසමින් කග පතින් දෙපළුව අසුරසෙන්" යන කවි පද ඇතුළත් වන්නේ,
(1) සිංහරාජ වන්නමට ය. (2) සැවුලා වන්නමට ය.
(3) මුසලඩි වන්නමට ය. (4) තුරගා වන්නමට ය.

33. තාකු තක්කුං තරිකිට ............ මෙහි ඉතිරි පද කොටස වන්නේ,
(1) තකට ජෙං ජෙං (2) ජිකුද තත්ජෙං (3) තකුඳ තත්ජෙං (4) තකට දොං දොං

34. උඩරට නර්තන සම්ප්‍රදාය පිළිබඳ උපාධියක් ලබාගත් නර්තන විෂයේ විද්වතුන් අතරින් මහාචාර්ය පදවියක් ලබාගත් ප්‍රථම ශ්‍රී ලාංකිකයා වන්නේ,

(1) එස්. පණීභාරත මහතා (2) ජයසේන කෝට්ටගොඩ මහතා

(3) මුදියන්සේ දිසානායක මහතා (4) රවිබන්දු විද්‍යාපති මහතා

35. උෆරා යක්කමේදී රංග භාණ්ඩයක් ලෙස උෆරාගේ රුව නිර්මාණය කරන්නේ,

(1) පොල් බඩයකින් ය. (2) පුවක් බඩයකින් ය.

(3) මැටිවලින් ය. (4) කෙසෙල් බඩයකින් ය.

36. සුරල් පෑගීම පිළිබඳ මනා පුහුණුවක් ලබාගත හැකි කස්තිරමක් ඇතුලත් ගොඩ සරඹය වන්නේ,

(1) චන්ද්‍රිකා හරඹයයි. (2) ඇල හරඹයයි. (3) බඹර හරඹයයි. (4) අංගහාර හරඹයයි.

37. හිස වෙස් තැබීමේ මංගල්‍යයේදී සුභ මොහොතින් ප්‍රථමයෙන් පළඳවනු ලබන ආභරණය වන්නේ,

(1) වෙස් තට්ටුව (2) පායින්පත (3) නෙත්තිමාලය (4) ජටාව

38. ගැට බෙරයට ආවේනික කොටස් වන්නේ,

(1) සුරත් තට්ටුව, වෙන්වර, වරමුදු ය. (2) වෙනිවර, කැපුම්හම, බෙරපුහුල ය.

(3) හයිතට්ටුව, ඉල්ලම්, බෙරපුහුල ය. (4) වරමුදු, ගැටිය, ඉල්ලම්

39. මාත්‍රා 3 + 4 දෙතිතට ගැටබෙරයෙන් වාදනය කළ හැකි බෙර පදයකි.

(1) දොං ජිංත ගත දොංත (2) දොදොංත තකු දොං

(3) දොං දොං ජිං ජිං ගජි ගත (4) දෝං ජිං ජිං තකට දොං තක

40. උඩරට වෙස් ඇඳුම් කට්ටලයේ අතේ මැණික් කටුව අසල පළඳින ආභරණය වන්නේ,

(1) ශිඛාබන්ධනයයි. (2) කෙපුඩි වළල්ලයි. (3) කෙමෙත්තයි (4) අවුල්හැරයයි.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2019

11 ශ්‍රේණිය

# නර්තනය - II

කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි ඃ
- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

(01) i. දහවන ගොඩ සරඹය .................................................................................... සරඹය නමින් හැඳින්වේ.

ii. කල්පිත දේව සමූහයා වර්ණනා කරමින් හා දෙවියන්ගෙන් පිහිට පැතීමේ අරමුණෙන් රචනා වූ වන්නම් ලෙස ........................................................................ හැඳින්විය හැක.

iii. කථකලි නර්තනයේ වේෂ නිරූපණ ශිල්පියා ............................................................... ලෙස හැඳින්වේ.

iv. ප්‍රථම රාජ්‍ය මුද්‍රා නාට්‍ය උළෙල පවත්වන ලද්දේ ................................................................ වර්ෂයේදී ය.

v. කතා පුවතේ සඳහන් පරිදි සොකරිය ඇතුළු පිරිස ලංකාවට පැමිණියේ ............................................ දේශයේ සිට ය.

vi. නැටුම්, ගැයුම්, වැයුම් සඳහා සරස්වතී මණ්ඩපය ඉදිකළ රජු වන්නේ .............................................. රජතුමා ය.

vii. බෙර වාදනයේදී බීජාක්ෂර ............................................................................... ලෙසද හැඳින්වේ.

viii. දුටුගැමුණු රජු මහා සෑය බැඳීම සඳහා වඩුවන් රැස්කරවීමට .................................................... වැයූ බව ථූපවංශයේ සඳහන් වේ.

ix. සතර අභිනයේදී අංග රචනය හා ගීත ගායනය අයත්වන අභිනයක් වන්නේ,

i. අංග රචනය ........................................ ii. ගීත ගායනය .......................................................

x. කිරීටම් සහ මකුට පළඳනාව යන හිස් පළඳනා ඇතුලත් භාරතීය නර්තන සම්ප්‍රදායන් වන්නේ,

i. කිරීටම් .................................................. ii. මකුට පළඳනාව ..................................................

(ල. 12)

(02) i. සුළු මහ දෙතිත (2 + 4) අයත් බෙර පදයක් ප්‍රස්ථාර කරන්න.

ii. මාත්‍රා හතරේ තනි තිතට (4 + 4) අයත් වන්නමක කවි පද දෙකක් ප්‍රස්ථාර කරන්න.

iii. මාත්‍රා 2 + 2 + 4 තුන් තිතට අදාළ අඩව්වක් ප්‍රස්ථාර කරන්න.

(03) පහත සඳහන් මාතෘකා අතුරෙන් තුනක් පිළිබඳ විස්තර කරන්න.

i. කප් සිටුවීම

ii. රස භාව සංකල්පය

iii. කෝලම් රඟමඩල

iv. ශාන්තිකර්මවල රංග භාණ්ඩ

v. රාස්ලීලා

(04) උඩරට, පහතරට, සබරගමු ශාන්තිකර්ම පැවැත්වීමේදී සමානතා මෙන්ම අසමානතා ද දක්නට ලැබේ.

i. සම්ප්‍රදායන් දෙකක ශාන්තිකර්මවල පුද ලබන දෙවිවරු ඇසුරෙන් උක්ත කරුණු සනාථ කරන්න.

ii. මඩු ශාන්තිකර්මවල චාරිත්‍ර විධි ඇසුරෙන් සමානතා පිළිබඳ විස්තරයක් කරන්න.

iii. කොහොඹා කංකාරියේ සහ දෙවොල් මඩුවේ පහන් මඩුවේ නර්තනාංගවල දැකිය හැකි සමාන අසමානතා පරීක්ෂා කරන්න.

(05) i. සෙම්බු හා කලගෙඩි නැටුම්වල ඇති සුවිශේෂ ලක්ෂණ විස්තර කරන්න.

ii. කෝලම් නාටකයේ චරිත ස්වභාව විස්තර කිරීමට ගායනා ඉවහල් වී ඇති ආකාරය සනාථ කරන්න.

iii. කරදිය මුදා නාට්‍යයේ රංග වස්ත්‍රාභරණ හා පසුබිම් අලංකරණ නාට්‍යයේ ගුණාත්මක බව වර්ධනය කිරීමට දායක වී ඇති ආකාරය විමසන්න.

(06)



A



B



C

i. A රූපරාමුවට අදාල නර්තන සම්ප්‍රදාය නම්කර එහි වේෂනිරූපණයේ එන චරිත වර්ග දෙකක් විස්තර කරන්න.

ii. C රූප රාමුවට අදාළ ශිල්පිණියගෙන් නර්තන කලාවට සිදුවූ සේවය අගයන්න.

iii. B රූප රාමුවට අදාළ නර්තනයේ භාවිත සංගීත සම්ප්‍රදාය නම් කර භාවිතා කරනු ලබන වාද්‍ය භාණ්ඩ පිළිබඳ විස්තරයක් කරන්න.

(07) i. නර්තන කලාවට චිත්‍ර කලාවෙන් ලැබෙන පිටිවහල පිළිබඳ විස්තරයක් කරන්න.

ii. “අන්තර් ජාතික සම්බන්ධතා නිසා ලාංකික නර්තනය වේගවත් සංවර්ධනයක් කරා යොමු වී තිබේ.” විස්තර කරන්න.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2019

**11 ශ්‍රේණිය** **නර්තනය - ප්‍රායෝගික පරීක්ෂණය**

සැලකිය යුතුයි :
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

---

(01) ක්‍රියාකාරකම - ගායනය හා වාදනය
- (i) කැමති ගායනය (ල. 05)
- (ii) නම්කරන ලද ගායනය (විෂය නිර්දේශයට නියමිත ගායනයක් නම් කරන්න) ගුරුවරයා විසින් කළ යුතු ය. (ල. 05)
- (iii) කැමති බෙර සරඹයක් (ලය තුනට) (ල. 05)
- (iv) දෙතිතේ තාල රූපයට අයත් බෙර පදයක් වාදනය කිරීම (ල. 05)(මුළු ලකුණු 20)

(02) ක්‍රියාකාරකම - සරඹ හා වට්ටම් නැටීම
- (i) 8 සිට 12 ගොඩ සරඹවලින් එකක් නර්තනය (ල. 05)
- (ii) සරඹයට අදාළ කස්තරම නර්තනය (ල. 05)
- (iii) වට්ටම් (විෂය නිර්දේශයට අදාළ) පදය හා කස්තිරම (ල. 05)
- (iv) අදාල අඩව්ව නැටීම (ල. 05)(මුළු ලකුණු 20)

(03) ක්‍රියාකාරකම - වන්නම් නැටීම (සම්පූර්ණයෙන්)
- (i) 6 - 11 ශ්‍රේණිවලට අදාල වන්නම්වලින් එකක් නර්තනය (ල. 10)
- (ii) කස්තිරම/ සීරුමාරුව/ අඩව්ව නර්තනය (ල. 10)(මුළු ලකුණු 20)

(04) ක්‍රියාකාරකම - ගැමි හා ජීවන වෘත්තීන් හාා බැඳි නර්තන
- (i) කඩු/ රබන්/ චාමර/ මෝල්ගස් (ල. 10)
- (ii) කැමති වෘත්තියක් අනුකරණයෙන් (ධීරව, කෘෂි, මැටි, පතල්, කොහු, තේ) (ල. 10)(මුළු ලකුණු 20)

(05) ක්‍රියාකාරකම
- (i) නාට්‍ය ගීතයකට අනුව රංගනය (මෙම ගිම්හාන/ හනික වරෙව්/ දී කිරි දී කිරි/ වාසනා දිනේකි) (ල. 10)
- (ii) චරිත/ සිද්ධි ඇසුරින් නිර්මාණ කුසලතා පහත ඒවායින් එකක් පමණක් තෝරාගන්න. (ල. 10)
  1. සාගින්නේ පෙළෙන වඳුරෙකි. කසල බඳුනක තිබී කෙසෙල් ගෙඩියක් දැක සතුටින් බුදින විට වඳුරු රංචුවක් පැමිණේ. ඔවුන් පලවා හැර සතුටින් ආහාර අනුභව කරයි.
     චරිතය - වඳුරා
  2. කූඩයක් හිසින් ගෙන එළවලු විකුණන කාන්තාවකි. එළවලු විකුණා මුදල් රැස් කරයි. උපයාගත් මුදලින් කොටසක් යොදා දානයක් සකසා පූජාකොට සිත පහන් කරගනී.
     චරිතය - එළවලු වෙළෙන්දිය
  3. ගෝනකු ලුහුබඳිමින් යන දඩයක්කරුවෙකි. හදිස්සියේ ඔහු වළකට ඇද වැටේ. මහත් වෙහෙසක් දරා දඩයක්කරු එම වලෙන් ගොඩට පැමිණේ.
     චරිතය - දඩයක්කරු (මුළු ලකුණු 20)

(මුළු ලකුණු 100)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (3) | 02. (2) | 03. (4) | 04. (2) | 05. (4) | 06. (3) | 07. (4) | 08. (2) | 09. (3) | 10. (2) |
| 11. (3) | 12. (1) | 13. (2) | 14. (4) | 15. (1) | 16. (4) | 17. (1) | 18. (4) | 19. (1) | 20. (4) |
| 21. (1) | 22. (3) | 23. (4) | 24. (1) | 25. (1) | 26. (3) | 27. (4) | 28. (1) | 29. (3) | 30. (2) |
| 31. (1) | 32. (2) | 33. (3) | 34. (3) | 35. (4) | 36. (1) | 37. (4) | 38. (2) | 39. (4) | 40. (3) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) i. බඹර ii. සිංදු වන්නම් iii. පත්තුකාරන් iv. 1961

v. කාසි vi. මහා පරාක්‍රමබාහු vii. ස්වාක්ෂර viii. අණබෙර

ix. (i) ආහාර්ය අභිනය (ii) වාචික අභිනය

x. (i) කතකලී නර්තනය (ii) මනිපුරි නර්තනය (ලකුණු 12)

02. (i) (ii) (iii) නිවැරදි විභාගවලට වෙන්කිරීම හා සංකේත භාවිතයට (ල. 02)

පද නිවැරදිව ප්‍රස්ථාර කිරීමට (ල. 02)

(ල. 04)

( 4 × 3 = ලකුණු 12)

03. (i) <u>කප් සිටුවීම</u>

- ශාන්තිකර්මවල පූර්ව චාරිත්‍රයක් වනබව
- කිරිගසක අත්තක් සිටවීමට යොදාගන්නා බව
- නිශ්චිත ස්ථානයේ ගොක්රැහැන් ඇද මල් පැලක් තනවා යාතිකා පවත්වමින් කප සිදුවීම සිදුවන බව

(ii) <u>රසභාව සංකල්පය</u>

- රසභාව නම්කර තිබීම හා රස භාවයට මූලික වන ස්ථායි භාව ඇති බව
- මිනිසාට ඇතිවන හැඟීම් රසභාව යනුවෙන් හඳුන්වන බව
- භාරතීය කෘතිවල රසභාව සංකල්පය පිළිබඳ විස්තර කර ඇතිබව.

(iii) <u>කෝලම් රඟමඩල</u>

- රඟමඩල තානායම්පොළ නමින් හඳුන්වන බව
- එළිමහනේ ඇති වටකුරු රඟමඩලක් වන අතර ප්‍රේක්ෂකයේ වටේට බිම හිඳගෙන නරඹන බව
- වෙස් අත්ත, නේපත්‍යාගාරය පිළිබඳ කරුණු දැක්වීම
- රූප සටහන් මගින් පැහැදිලි කිරීම.

(iv) <u>ශාන්තිකර්මවල රංග භාණ්ඩ</u>

- රංග භාණ්ඩ සකස්කර ගැනීම සඳහා පරිසරයේ ඇති ස්වභාවික අමුද්‍රව්‍ය යොදාගන්නා බව
- කොහොඹා කංකාරියේදී දුන්න, ඊතලය, පොල්මල, කෙසෙල් බඩයෙන් සෑදූ ඌරාගේ රුව, වංගෙඩිය, නව කොළ අත්ත ආදිය සකස්කරගන්නා බව
- දෙවොල් මඩුවේදී අත් පන්දම්, දොළහ පෙළපාලියේ පූජා භාණ්ඩ (කුඩ, කොඩි, සේසත්) ආදිය සකස්කර ගන්නා බව.
- පහන් මඩුවේදී පොල්මල, පන්දම්, හත්පද පෙළපාලියේ පූජා භාණ්ඩ දවිමුර ආදිය යොදා ගන්නා බව
- මෙම උදාහරණවලට අමතරව වෙනත් අදාල රංග භාණ්ඩ පිළිබඳව සඳහන්කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.

**පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස**

(v) <u>රාස්ලීලා</u>
මනිපුරි නර්තන සම්ප්‍රදායේ ශාස්ත්‍රීය නර්තන අංගයක් බව
රාධා ක්‍රිෂ්ණා ප්‍රේම වෘතාන්තයේ ගෙගෝපිකාවන් හා සම්බන්ධ කථා ප්‍රවෘත්තිය රඟ දැක්වෙන බව
කෝවිල්වල එළිමහනේ රඟදක්වන බව
ක්‍රිෂ්ණා හා සම්බන්ධ බොහෝ ගීත කවි ඇතුලත්ව ඇති බව ( 4×3 = ල. 12)
මහා රාස්, වසන්ත රාස්, කුංජ රාස්, නෘත්‍ය රාස්, දිවා රාස් ලෙස පංච රාස් එක්වී ඇති බව.

04 (i) උඩරට - බණ්ඩාර දෙවි සත්තට්ටුව, කොහොඹා දෙවි තුන් තට්ටුව, වීරමුණ්ඩ දෙවි
පහතරට - පත්තිනි දෙවි, දෙවොල් දෙවි ඇතුළු පිරිස, සිව්වරන් දෙවිවරු
සබරගමු - පත්තිනි දෙවි, දෙවොල් දෙවි ඇතුළු පිරිස සිව්වරන් දෙවිවරු, සමන් දෙවි
සම්ප්‍රදායන් තුනෙහි පුදලබන දෙවිවරුන්ගේ සමාන අසමානතා දක්වා තිබීම. (ල. 04)

(ii) දෙවොල් මඩුව
චාරිත්‍ර විධි :- කප් සිටුවීම, තොටමෙට යෑම, මිල්ල කැපීම, මඩු පේ කිරීම, මලපේ කිරීම, මගුල්බෙර වාදනය
පහන් මඩුව :- කප් සිටුවීම, තොටපේකිරීම, මල පේ කිරීම, මඩු පේ කිරීම, මිල්ල කැපීම මගුල් බෙර වාදනය (ල. 04)

(iii) කොහොඹා කංකාරිය - නර්තන අංග
- යක් ඇනුම, අස්නෙ, ආවැන්දුම, හත්පදය, දුනුමාලප්පුව, කොහොඹ හැල්ල, කෝල්පාඩුව, යක්තුන් පදය

දෙවොල් මඩුව
- යහන් දැක්ම, මුදුන් තාලය, පන්දම් පද, හත්පද පෙළපාලිය, පන්දම්පද

පහන් මඩුව
- යහන් දැක්ම, මුදුන් තාලය, පන්දම්පද, හත්පද පෙළපාලිය, පන්දම්පද
- නාමිකව යම් සමානතා ලක්ෂණ ඇති බව
- සාම්ප්‍රදායික ලක්ෂණ ඇති බව
- කවි ගායනා කිරීම නොකරණ බව (උඩරට හත් පදය ආදියේදී)

ආදී වශයෙන් කරුණු දක්වා තිබීම. (ල. 04)

05 (i)
- රංග වස්ත්‍රාභරණවල සුවිශේෂතා
- ගායනායහි හා වාදනයෙහි ඇති විශේෂ ලක්ෂණ
- විනෝදාස්වාදය සඳහා රචනා වීම.
- චලනවල සුවිශේෂතා
- භාවිතාකරන භාණ්ඩවල සුවිශේෂතා ආදීවශයෙන් මෙම කරුණු ඇතුළත්ව උදාහරණ සපයමින් පිළිතුරු සකස් කිරීම. (ල. 04)

(ii)
- කෝළම් නාටකයේ ආරම්භයේ සිට අවසානය තෙක් ම සිද්ධීන් සහ චරිතවල ස්වභාවයන් ගායනාවලින් හඳුන්වාදෙන බව
- සෑම චරිතයක්ම සභාවට පැමිණීමට පෙර කෙටිකවිවලින් හඳුන්වා දෙන බව.
- සභාවට පැමිණි පසු දිග කවි ගයමින් චරිතය ඉදිරිපත් කරන බව උදාහරණ සහිතව දක්වා ඇත්නම් (ල. 04)

(iii)
- ධීවර ගැමි ජනතාවගේ ස්වභාවයත් එම පරිසරයත් මවා පෙන්වීමට හැකි වී ඇති බව
- රංග වස්ත්‍රාභරණ නිර්මාණයේදී චරිත සඳහා උචිත වර්ණ භාවිතාකර ඇති බව
- මකුළුවාගේ හා මැස්සන්ගේ රංග වස්ත්‍රාභරණ චරිත ලක්ෂණමනාව විදහා දැක්වෙන අවස්ථාවක් බව
- මෙම අංශ දෙකෙහිම නිර්මාණ ශිල්පියා සෝමබන්දු විද්‍යාපති මහතා බව
- ධීරව පරිසරය මැවීමට ගල්පර, පැල්පත, මුහුදු රල, වැටකෙයියා පඳුරු ආදිය යොදාගෙන තිබීම (ල. 04)

## පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

06 (i) A = කතකලි නර්තන සම්ප්‍රදාය

B = මිනික්කු, පච්චා, කත්ති, තාඩි ..... යන වර්ගවලින්

සම්ප්‍රදාය නම් කිරීමට ල. 01, චරිත දෙකක් විස්තර කිරීමට ල. 03

(ii) මිරැන්ඩා හේමලතා මහත්මිය

- සමස්ත ලංකා නැටුම් තරග ක්‍රමවත් කිරීම
- කථිකාචාර්යවරියක ලෙස තම ශිල්ප ඥානය ගුරු සිසුන්ට ලබා දීම.
- නර්තන විෂය සංවර්ධනයට ගුරුඅත්පොත්, විෂය මාලා, ගුරු මාර්ගෝපදේශ, දුරස්ථ ගුරු පුහුණු, නර්තන සම්මන්ත්‍රණ ආදිය කාර්යයන් සිදු කිරීම.
- අ.පො.ස. (සා. පෙළ) හා උ. පෙළ ප්‍රශ්නපත්‍ර ව්‍යුහය හා ප්‍රායෝගික ඇගයීම් කටයුතු විධිමත් කිරීම.
- නර්තන ප්‍රසංග හා ඉගිනළු නිර්මාණය කිරීම.
- මෝල්ගස් නැටුම නව රංග රටා මුසුකරමින් ජනප්‍රිය කරවීම.

නම් කිරීමට ල. 01 කරුණු 3ක් විස්තර කිරීමට ල. 03

(iii) • උත්තර භාරතීයය රංගධාරී සංගීතය/ හින්දුස්ථානී සංගීතය

පුං - අවනද්ධ භාණ්ඩයකි. ලීයෙන් තනා ඇති අතර මැදින් මහත්ව දෙකෙළවර ක්‍රමිකව සිහින් වී ඇත.
ඉතා ලගින් යෙදූ හම් වරපටි ඇත.
එක් ඇසක් අඟල් 6ක් විෂ්කම්භය ඇති අතර අනෙක් ඇස අඟල් 4ක් පමණ වේ.
දෙපසෙහිම ඇසට බදාම යොදා තිබේ.
වාදනයේදී බඳ සුදු රෙදිකඩකින් ආවරණය කරයි.

පෙනා - තත් භාණ්ඩයකි. එක් තතක් පමණක් ඇත. අළුවකින් වයයි.

බටනලාව, හග්ගෙඩිය, එස්රාජය, තාලම්පට භාවිතා කරයි.

සංගීත සම්ප්‍රදාය නම් කිරීමට - ල. 01 භාණ්ඩ පිළිබඳ විස්තරයට ල. 03

07 (i)

- චිත්‍රයේදී ප්‍රමුඛ වන්නේ වර්ණ රේඛා හැඩතලයි. මෙය නර්තනයට යොදාගනු ලබන බව
- නර්තන නිර්මාණයේදී අවකාශ භාවිතයේදී යොදාගන්නා මෝස්තර, රටා, දිසා, තල ආදිය ජ්‍යාමිතික හැඩතලමත ගොඩනැගීම වනබව
- පැළඳුම් පැළඳුම් නිර්මාණයේදී යොදාගන්නා මෝස්තර, හැඩතල හා වර්ණ භාවිතය සිදුවන බව
- ඇඟීම්, නෙළීම්, විවිධ සැරසිලි, ශාන්තිකර්මවලදී හා බලියේදී යොදාගන්නා බව
- නර්තනයේ රිද්මය හා ප්‍රාසාංගික බව වර්ධනය කර ගැනීමට චිත්‍රකලාව බලපාන බව ආදී වශයෙන් සාධනීය ලෙස පිළිතුරු ලියා ඇත්නම් ල. 06

(ii)

- විවිධ ජාතීන්ට අයත් නර්තන හැදෑරීම හා අගය කිරීමෙන් සම්බන්ධතා ගොඩනැගෙන බව
- අංගහාර, රංග වස්ත්‍රාභරණ, අංග රචනය, සංගීතය හා තාක්ෂණික ශිල්පීය ක්‍රම හා මෙවලම් මෙම සබඳතා තුළින් ලබා ඇති බව.
- විදේශීය රටවලට ගොස් නර්තනය හැදෑරීම නිසා විදේශීය ගුරු සිසු සබඳතා ඇතිවීම.
- නර්තන කණ්ඩායම් විදේශීය රටවලදී සංදර්ශන පැවැත්වීම හා රාජ්‍ය නියෝජනය කරමින් දේශීය නර්තන විදෙස් නායකයන් පිළිගැනීම වැනි අවස්ථා සඳහා යොමුකරන බව
- නර්තනය විශ්ව විද්‍යාල මට්ටම දක්වා පැතිර ඇති බැවින් එමගින් විදේශීය අරවලට ගොස් ආචාර්ය උපාධි ලබාගත හැකි බව ආදී වශයෙන් විචාරාත්මකව කරුණු ඉදිරිපත් කර ඇත්නම් ල. 06